# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2488/17 – 2026 මැයි මස 13 වැනි බදාදා – 2026.05.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 03, නත්තඹුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නත්තඹුර ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේජ්/ආර්එම්බී/2025/245 හා 2025.10.02 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන කැබලි අංක "ඒ" සිට "බී" වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0807 ක් පමණ වන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලි වලට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' - මීයන්පිටිවත්ත - ප්‍රමාණය : හෙක්. 0.0768**

උතුරට: මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 3, හිමිකම් කියන්නා සොයාගත නොහැකි මීයන්පිටියවත්ත සහ මෙම අනුරේඛනයේ කැබලි අංක බී; නැගෙනහිරට: මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 3 සහ එම්. එන්. රණසිංහ හිමිකම් කියන මීයන්පිටියවත්ත; දකුණට: එම්. එන්. රණසිංහ හිමිකම් කියන මියන්පිටියවත්ත; බටහිරට: එම්. එන්.රණසිංහ හිමිකම් කියන මීයන්පිටියවත්ත.

**2. කැබලි අක්ෂර ' බී' - ඉඩමේ නම, මීයන්පිටියවත්ත - ප්‍රමාණය: හෙක්. 0.0039**

උතුරට: මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 3 සහ හිමිකම් කියන්නා සොයාගත නොහැකි මීයන්පිටියවත්ත; නැගෙනහිරට: මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - අදියර 3 සහ මෙම අනුරේඛනයේ කැබලි අංක ඒ; දකුණට: කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අංක ඒ.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/12/2025/HW/50.
2026 අප්‍රේල් මස 06 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 05 - 0054